# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 6 දරන
# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.65 යි — තැපැල් ගාස්තුව : ශත 90 යි

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 30/80.

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවීම සඳහා ද 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනත ඉවත් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවීම, එහි අරමුණු හා බලතල

2. (1) (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යනුවෙන් හැඳින්වෙන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතුය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් එයට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එහි සංස්ථා නාමයෙන් එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පැවරීම ද කරනු ලැබිය හැකිය.

3. ආයතනයේ පොදු අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතුය— ආයතනයේ අරමුණු.

(අ) නිර්මාණ, වෙළෙඳ ද්‍රව්‍ය, නිෂ්පාදන, ද්‍රව්‍ය, ව්‍යවහාර සහ ක්‍රියාවලි හා සම්බන්ධයෙන් ජාතික සහ අන්තර් ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම සහ ඒවා කලින් කල පරිශෝධනය කිරීම, වෙනස් කිරීම හා සංශෝධනය කිරීම සහ ඒ ප්‍රමිති පොදුවේ පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන භාවිතය ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා රසායනාගාර සහ පුස්තකාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ ඊට අදාළ පහසුකම් සැපයීම;

(ඈ) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍ය සහ ඖෂධ ඇතුළු නිෂ්පාදන, වෙළෙඳ ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය, 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතට හෝ තත්ත්ව ප්‍රමිති හෝ අන්‍යාකාර ප්‍රමිති මෙන් ම දේශීය වශයෙන් නිෂ්පාදිත නිෂ්පාදන, වෙළෙඳ ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය සෑදීමෙහි ලා යොදා ගන්නා පිරිසැකසුම් ක්‍රම සහ ව්‍යවහාර පිළිබඳ වූ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූල වන්නේ දැයි නිශ්චය කරනු පිණිස පරීක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීම;

—ඒ 073985—8,525 (83/12)

(ඉ) සූක්ෂ්ම උපකරණ, මිනුම් ගන්නා උපකරණ සහ විද්‍යා උපකරණ පරීක්ෂා කිරීම සහ ප්‍රමාණ ශෝධනය සඳහාත් නියමිත ප්‍රමිතිවලට අනුකූල වනසේ ඒවා සම්බන්ධයෙන් සහතික නිකුත් කිරීම සඳහාත් වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීම;

(ඊ) ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය හා සම්බන්ධ පර්යේෂණ කටයුතු කිරීමට පහසුකම් සැලැස්වීම හෝ පිළියෙල කිරීම;

(උ) මේ පනතේ අදාළ විධිවිධානවලට අනුකූලව, සහතික ලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම;

(ඌ) දේශීය පරිභෝජනය සඳහා වූ හෝ අපනයනය සඳහා වූ හෝ වෙළෙඳ ද්‍රව්‍ය, ද්‍රව්‍ය, නිෂ්පාදිත, නිෂ්පාදන සහ වෙනත් දේවල තත්ත්වය සහතික කිරීම;

(එ) අධ්‍යාපනික, උපදේශක සහ වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඒ) ආයතනය පිහිටුවනු ලබන්නේ යම් අරමුණු සඳහා ද ඒ සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තන්, සංගම් හෝ සංවිධාන සමග සහයෝගිතාව සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඔ) වෙළෙඳ ද්‍රව්‍යවල, ද්‍රව්‍යවල, නිෂ්පාදනවල, උපකරණවල, පිරිසැකසුම්වල සහ ක්‍රමවල තත්ත්වය වැඩිදියුණු කිරීමට නිෂ්පාදකයන්ගේ සහ පාවිච්චි කරන්නන්ගේ උත්සාහයන් සම්බන්ධීකරණය කිරීම.

ආයතනයේ බලතල.

4. ආයතනයට මෙහි පහත දැක්වෙන බලතල සියල්ලම හෝ ඉන් යමක් තිබිය යුතු අතර ආයතනය විසින් ඒවා ක්‍රියාත්මක කළ හැකිය:—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපලක් කවර වූ හෝ ආකාරයකින් අත්කර ගැනීම, ඇරීම, බද්දට හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) යම් නව නිපැයුමක් හෝ සොයාගැනීමක් පිළිබඳ තොරතුරු ප්‍රයෝජනයට ගැනීමේ අනන්‍ය, අනන්‍ය නොවන හෝ සීමාසහිත අයිතිවාසිකම් පැවරෙන පේටන්ට් බලපත්‍ර, වර ප්‍රසාද ලියවිලි, නව නිපැයුම්, සහන මුදල්, බලපත්‍ර සහ ඒ සමාන වෙනත් දේ සඳහා ඉල්ලුම් කිරීම, ඒවා මිලට ගැනීම, පැවරීමක් මගින් ලැබීම හෝ ඒ කාර්යය සඳහා තත් කාලයෙහි අදාළවන නීතිවලට අනුකූලව අන්‍යාකාරයකින් අත්කර ගැනීම සහ එසේ අත්කර ගන්නා ලද දේපළ, අයිතිවාසිකම් සහ තොරතුරු වර්ධනය කිරීම, ප්‍රයෝජනයට ගැනීම, ක්‍රියාත්මක කිරීම, පවරාදීම, අත්සතු කිරීම, විකිණීම, ඒ වෙනුවෙන් බලපත්‍ර දීම හෝ අන්‍යාකාරයකින් භාවිත කිරීම;

(ඇ) ආයතනයට ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා උපකාර විය හැකියැයි පෙනෙන යම් භාර හෝ වෙනත් ඒජන්සි ව්‍යාපාර ක්‍රියාවේ යෙදීම සඳහා භාර ගැනීම;

(ඈ) ආයතනය විසින් නඩත්තු කරන රසායනාගාර හැර වෙනත් රසායනාගාර, ඒවායේ අයිතිකරුවන්ගේ අවසරය ඇතිව ප්‍රයෝජනයට ගැනීම සහ ආයතනයේ කාර්ය සඳහා ඒ රසායනාගාර අනුමත කිරීම;

(ඉ) ස්වකීය අරමුණු සඳහා වහා අවශ්‍ය නොවන ආයතනයේ යම් මුදල්, සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සපයන යම් සේවාවන් සඳහා, සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තු අය කිරීම; සහ

(උ) ආයතනයේ කර්තව්‍ය කිසිවක් ඉටු කිරීමට හෝ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නාවූ හෝ ආනුෂංගික වන්නා වූ හෝ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම් සඳහා අවශ්‍ය වන්නාවූ හෝ ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ හෝ කෙලින්ම නැතහොත් අන්‍යාකාරයකින් ආයතනයේ යම් දේපළ හෝ අයිතිවාසිකම්වල අගය වැඩි කිරීම අරමුණු කොටගත් සියලු දේ කිරීම.

අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධාන.

**5.** (1) ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී, සභාව අමාත්‍යවරයා විසින් තත් කාර්යය වෙනුවෙන් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි පොදු හෝ විශේෂ හෝ විධානවලට යටත් විය යුතු අතර ඒ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(2) ආයතනයේ කටයුතු සියල්ල හෝ යම් කටයුත්තක් හෝ පිළිබඳව අමාත්‍යවරයා විසින් නියම කරන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට වාර්තා කළ යුතු යයි කලින් කල අමාත්‍යවරයා විසින් නියම් කළ හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් ලබාදීම සහ සියලු තොරතුරු සැපයීම සභාව විසින් කළ යුතුය.

ආයතනයේ බලතල කාර්ය සහ කර්තව්‍ය සභාව වෙත පැවරීම සහ සභාවේ සංයුතිය.

**6.** (1) ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, සභාව වෙත පැවරෙන අතර. සභාව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත විය යුතුය. ඒ සාමාජිකයන් අතුරෙන්—

(අ) සාමාජිකයන් තුන් දෙනකු විද්‍යාව, වාණිජ කටයුතු, කර්මාන්ත හෝ පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨතා ලබා ඇති හෝ ආයතනයේ වැඩ කටයුතුවල යම් අංශයක් හා සම්බන්ධ අන් විශේෂ සුදුසුකම් ඇති තැනැත්තන් අතුරෙන් විය යුතු ය;

3—ඒ 073985 (83/12)

(ආ) එක් සාමාජිකයකු, මහා භාණ්ඩාගාරයේ නිලධරයන් අතුරෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා පත් කරන ලද තැනැත්තකු විය යුතු ය;

(ඇ) එක් සාමාජිකයකු, 1981 අංක 78 දරන ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බල ශක්ති සහ විද්‍යා අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බල ශක්ති සහ විද්‍යා අධිකාරියේ නිලධරයන් අතුරෙන්, ඒ පනතේ විෂයය භාර අමාත්‍යවරයා විමසා පත් කරන ලද තැනැත්තකු විය යුතු ය;

(ඈ) එක් සාමාජිකයකු, කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ ඒ අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන දෙපාර්තමේන්තුවක නැතහොත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ නිලධරයන් අතුරෙන් එක් තැනැත්තකු විය යුතුය.

(ඉ) එක් සාමාජිකයකු, වෙළඳ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ ඒ අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන දෙපාර්තමේන්තුවක නැතහොත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ නිලධරයන් අතුරෙන්, ඒ අමාත්‍යවරයා විමසා පත් කරන ලද තැනැත්තකු විය යුතු ය;

(ඊ) එක් සාමාජිකයකු, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ඉදිරිපත් කරන, තැනැත්තන් තුන් දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින් එක් තැනැත්තකු විය යුතු ය;

(උ) එක් සාමාජිකයකු, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය විසින් ඉදිරිපත් කරන, තැනැත්තන් තුන් දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින් එක් තැනැත්තකු විය යුතු ය;

(ඌ) එක් සාමාජිකයකු, වෙළෙඳ සහ කර්මාන්ත සංගම් සම්මේලනය විසින් ඉදිරිපත් කරන, තැනැත්තන් තුන් දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින්, එක් තැනැත්තකු විය යුතු ය; සහ

(එ) එක් සාමාජිකයකු තත් කාලයෙහි, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන තැනැත්තා විය යුතු ය.

(2) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සාමාජිකයකුට, මාස තුනක් ඉක්මවන කාලසීමාවකට, ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ කාලසීමාව තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු, අමාත්‍යවරයා විසින්, සභාපතිවරයාගේ නිර්දේශය මත, (1) වන උපවගන්තියට අනුකූලව පත් කරනු ලැබිය හැකිය.

සභාවේ සභාපතිවරයා.

7. (1) අමාත්‍යවරයා විසින්, සභාවේ සාමාජිකයන් අතුරෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා හැර එක් සාමාජිකයකු, සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතුය.

(2) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, සභාවේ උපසභාපතිවරයා විය යුතුය. සභාපතිවරයා නොමැති විට, හෝ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පවතින විට උපසභාපතිවරයා, සභාපතිවරයාගේ කාර්ය ඉටුකළ යුතු ය.

*සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම.*

**8.** යම් තැනැත්තකු වස්තු භංගත්වයට පත් වූවකු හෝ බංකොලොත් වූවකු බවට තීරණය කරනු ලැබ, ඔහුගේ වස්තු භංගත්වය හෝ බංකොලොත්භාවය සම්පූර්ණයෙන්ම හෝ තරමක් දුරට හෝ නොවැලැක්විය හැකි පාඩු නැතහොත් අභාග්‍යය නිසා සිදු වී ඇති බවට, නිසි බලය ඇති අධිකරණයක් විසින් සහතිකයක් ප්‍රදානය කර නොමැති නම්, ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

*සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.*

**9.** උපසභාපතිවරයා හැර, සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ධුරය හිස් කළහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය :

එසේ වුවද මියගිය හෝ ඉල්ලා අස්වූ හෝ සාමාජිකත්වයෙන් ඉවත් කරන ලද හෝ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සභාවේ සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතුය.

*උපසභාපතිවරයා හැර සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම.*

**10.** අවස්ථාවෝචිතයැයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ඔහු විසින්, උපසභාපතිවරයා හැර, සභාවේ වෙනත් කවර හෝ සාමාජිකයකු, කිසි හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කළ හැකි අතර, ඒ ඉවත් කිරීම පිළිබඳව කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය :

එසේ වුව ද යම් අමාත්‍යවරයෙක් හෝ අධිකාරියක් විමසා යම් සාමාජිකයකු පත් කරන ලද අවස්ථාවක, ඒ සාමාජිකයා, ඒ අමාත්‍යවරයා හෝ අධිකාරිය නොවිමසා මේ වගන්තිය යටතේ ඉවත් කරනු නොලැබිය යුතු ය.

*නැවත පත් කරනු ලැබීමට සුදුසුකම.*

**11.** උපසභාපතිවරයා හැර, කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

*සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.*

**12.** අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පාරිශ්‍රමික ලැබීමට හිමිකම ඇති උපසභාපතිවරයා හැර, අනෙකුත් සියලුම සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට සහ ප්‍රමාණයන් අනුව, ආයතනයේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවිය හැකි ය.

*සභාවේ රැස්වීම.*

**13.** (1) සභාවේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය, සාමාජිකයන් හතරදෙනකු විය යුතු ය.

(2) යටත්පිරිසෙයින් සභාවේ සාමාජිකයන් හතර දෙනකුවත් ශ්‍රී ලංකාවේ සිටින්නේ නම්, කවර හෝ ප්‍රශ්ණයක් පිළිබඳව තීරණයක් ගැනීම, අදාළ ලියකියවිලි ශ්‍රී ලංකාවෙහි සිටින සාමාජිකයන් අතරේ සංසරණය කිරීමෙන් සහ ඒ සාමාජිකයන් ඒ ප්‍රශ්නය පිළිබඳ ස්වකීය මතය සහ ඡන්දය ලිඛිතව සටහන් කිරීමෙන් කළ හැකි ය ; එවැනි අවස්ථාවක දී ඒ ප්‍රශ්නය ද ඒ පිළිබඳ මත සහ ඡන්දය ද

පිළිබඳ වාර්තාවක්, සභාවේ ඊළඟ රැස්වීමට ඉදිරිපත් කර, එය වාර්තා පොතෙහි වාර්තා ගත කළ යුතුය. තවද ඡන්ද සංඛ්‍යාවෙහි සමානත්වයක් ඇත්නම් ඒ ප්‍රශ්නය සභාවේ රැස්වීමක දී තීරණයක් කිරීම් සඳහා ඉදිරිපත් කළ යුතුය.

(3) මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව, සභාව විසින්, එහි රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකිය.

(4) සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක් සභාවේ කිසි ක්‍රියාවක් හෝ තීරණයක් හෝ නීති කෘත්‍යයක් බලරහිත නොවිය යුතුය.

මුද්‍රාව.

14. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් සාධන පත්‍රයක් හැර කවර හෝ සාධන පත්‍රයකට ආයතනයේ මුද්‍රාව තැබීම—

(අ) සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා, හෝ

(ආ) සභාවේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා සහ සභාවේ වෙනත් යම් සාමාජිකයකු, හෝ

(ඇ) එවැනි අවස්ථාවක දී සභාව වෙනුවෙන් ක්‍රියා කිරීමට සභාව විසින් බලය දී තිබිය හැකි සභාවේ යම් එක් සාමාජිකයකු සහ ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු

ඉදිරියට දී කළ යුතු අතර ඒ බව ඔවුන් සිය අත්සනින් සහතික කළ යුතු ය.

(2) ආයතනය විසින් යම් සේවයක් සැලසීම පිළිබඳ එකඟවීමක් ඇතුළත් වන සාධන පත්‍රයකට සභාවේ මුද්‍රාව තැබීම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු නොමැති නම්, එවැනි අවස්ථාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් ක්‍රියා කිරීමට, සභාව විසින් බලය දී ඇති, ආයතන කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ ඉදිරියේ කළ යුතු අතර, මුද්‍රාව තැබීම ඔහු විසින් සිය අත්සනින් සහතික කළ යුතු ය.

සභාවේ බලතල සහ කාර්ය පැවරීම.

15. (1) සභාව විසින්, ස්වකීය බලතල සහ කාර්ය යමක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, සභාවේ යම් සාමාජිකයකුට නැතහොත් මේ පනත යටතේ පිහිටුවනු ලබන යම් කමිටුවකට හෝ ආයතනයේ යම් සේවා නියුක්තයකුට හෝ පැවරිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාවේ බලතල හෝ කාර්ය යමක් පවරා දෙනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයා, සාමාජිකයා හෝ සේවා නියුක්තයා, එසේ පවරා දෙන ලද බලතල සහ කාර්ය, සභාවේ විශේෂ හෝ පොදු විධානවලට යටත්ව ක්‍රියාත්මක කළ යුතු ය; නැතහොත් ඉටු කළ යුතු ය.

**16.** (1) සභාවේ කර්තව්‍ය ඉටු කර ගැනීමෙහි ලා ඊට සහාය වීම පිණිස සභාව විසින් කමිටු පිහිටුවාගත හැකි අතර, පත් කිරීම යෝග්‍යයැයි සභාව විසින් සලකනු ලැබිය හැකි (ආයතනයේ සේවා නියුක්තයකු වන හෝ නොවන) යම් තැනැත්තන්, සභාව විසින් ඒ කමිටුවල සාමාජිකයන් ලෙස පත් කළ හැකි ය. කමිටු පිහිටුවීම.

(2) එසේ පිහිටුවන ලද කමිටුවකට, ස්වකීය බලතලවලින් යෝග්‍යයැයි සභාව විසින් සලකනු ලැබිය හැකි බලතල, සභාව විසින් පැවරිය හැකි ය ; එහෙත් කමිටුවකට පවරා තිබිය හැකි යම් බලතල සභාවට අහිමි නොවිය යුතු ය. සභාව විසින් කමිටුව විසින් ගනු ලබන යම් තීරණයක් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) එවැනි යම් කමිටුවක සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික සහ දීමනා, ආයතනයේ අරමුදලින් ලැබිය හැකි ය.

## II වන කොටස

## සහතික ලකුණු

**17.** (1) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සඳහා හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නැතහොත් නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා ආයතනය විසින් අනුමත කරන ලද ප්‍රමිති පිරිවිතරක් වෙනුවෙන් ආයතනය විසින් පිළිගන්නා ලද යම් ලකුණක්, ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය වෙනුවෙන් නැතහොත් ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය සෑදීම, නිෂ්පාදනය, සකස් කිරීම හෝ පිරියම් කිරීම වෙනුවෙන් සහතික ලකුණක් බවට, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ආයතනය විසින්, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින් ප්‍රකාශයට පත් කළ හැකි අතර එවැනි යම් ලකුණක් ඒ ආකාරයෙන්ම අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකි ය. සහතික ලකුණු.

(2) අවශ්‍යතාවෝචිත පරිදි, 1979 අංක 52 දරන පනත මගින් ඉවත් කරන ලද වෙළෙඳ ලකුණු ආඥාපනත යටතේ සහ 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යටතේ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් වෙනුවෙන් ලියාපදිංචි කරන ලද යම් වෙළෙඳ ලකුණකට සර්වසම වූ හෝ ඒ ලකුණයැයි වරදවා හඳුනාගැනීමට ඉඩ ඇති තරමට ඒ ලකුණට බොහෝදුරට සමාන වූ කිසි ලකුණක්, ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය වෙනුවෙන් නැතහොත් සමාන වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් වෙනුවෙන්, එසේත් නැතහොත් ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය නැතහොත් සමාන වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය, සකස් කිරීම හෝ පිරියම් කිරීම වෙනුවෙන් සහතික ලකුණක් බවට, (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක, අදාළ ප්‍රමිති පිරිවිතර සම්බන්ධයෙන් හෝ එහි සංශෝධනය සම්බන්ධයෙන් හෝ අවශ්‍යයැයි ආයතනය විසින් සලකනු ලැබිය හැකි විස්තර ඇතුළත් විය යුතු ය.

සහතික ලකුණුවලට සර්වසම ලකුණු වෙළෙඳ ලකුණු ලෙස ලියාපදිංචි කිරීම තහනම් කිරීම.

18. 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සහතික ලකුණක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ලකුණකට සර්වසම වූ හෝ සහතික ලකුණක් යැයි වරදවා හඳුනාගැනීමට ඉඩ ඇති තරම් එසේ ප්‍රකාශයට පත් කරන ලද ලකුණකට බොහෝදුරට සමාන වූ කිසි වෙළෙඳ ලකුණක් 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යටතේ වෙළෙඳ ලකුණක් ලෙස කිසිම තැනැත්තකු විසින් ලියාපදිංචි කිරීමට නොසැලැස්විය යුතු ය.

බලපත්‍රවලින් බලය දී ඇත්නම් මිස ද මේ වගන්තියට අනුකූල වන ආකාරයට මිස ද සහතික ලකුණු වෙළඳ ද්‍රව්‍ය වලට හෝ නිෂ්පාදනවලට නොයෙදිය යුතු බව.

19. (1) ආයතනය විසින්, 17 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ යම් දැන්වීමක් පළ කර ඇති අවස්ථාවක, ඒ දැන්වීමේ සඳහන් සහතික ලකුණ—

(අ) ආයතනය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හෝ තත්කාර්යය සඳහා ආයතනය විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර ; සහ

(ආ) ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය, අදාළ ප්‍රමිති පිරිවිතරට අනුකූල වන්නේ නම් හෝ එය ඒ ප්‍රමිති පිරිවිතරට අනුකූලව සාදා නිෂ්පාදනය කොට, සකස් කොට, හෝ පිරියම් කොට ඇත්නම් මිස

කිසිම තැනැත්තකු විසින් කිසිම වෙළෙඳ ද්‍රව්‍යයකට හෝ නිෂ්පාදනයකට නොයෙදිය යුතුය.

(2) (අ) යම් වෙළෙඳ ද්‍රව්‍යයක හෝ නිෂ්පාදනයක ග්‍රාහකයකට හෝ ආවරණයකට හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක නැතහොත් නිෂ්පාදනයක ග්‍රාහකයකට නැතහොත් ආවරණයකට යාකර ඇති ලේබලයකට යම් සහතික ලකුණක් යොදන ; හෝ

(ආ) යම් සහතික ලකුණක් යොදන ලද නැතහොත් එවැනි ලකුණක් යෙදූ ලේබලයක් යාකර ඇති ග්‍රාහකයක හෝ ආවරණයක යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් බහාලන හෝ ඔතන ; හෝ

(ඇ) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක්, යම් සහතික ලකුණක් අදාළවන ප්‍රමිති පිරිවිතරට අනුකූල වන්නේය යන හැඟීම හෝ එය ඒ ප්‍රමිති පිරිවිතරට අනුකූලව සාදා නිෂ්පාදනය කොට, සකස් කොට හෝ පිරියම් කොට ඇතැයි යන හැඟීම ඇති කරවන ආකාරයකට හෝ ඒ හැඟීම ඇති කරවීම ඉලක්ක කොටගත් තත්ත්වයක් යටතේ ඒ සහතික ලකුණ ගැන, ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය අලෙවි කිරීමෙහි ලා යම් සඳහනක් කෙළින්ම හෝ වක්‍රව කරන

යම් තැනැත්තකු විසින්, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඒ වෙළෙඳ ද්‍රව්‍යයට හෝ නිෂ්පාදනයට ඒ සහතික ලකුණ යොදන ලදැයි සැලකිය යුතු ය.

(3) කිසිම තැනැත්තකු විසින්—

(අ) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සඳහා හෝ ඒ වෙළෙඳ ද්‍රව්‍යය නැතහොත් නිෂ්පාදනය සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා හෝ ආයතනය විසින් පිළියෙල කරන ලද ප්‍රමිති පිරිවිතර වෙනුවෙන් සහතික ලකුණක් බවට ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇතහොත් මිස ද ;

(ආ) ඒ සහතික ලකුණ ඒ වෙළෙඳ ද්‍රව්‍යයට හෝ නිෂ්පාදනයට යෙදීමට බලය දෙමින් ආයතනය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ඒ තැනැත්තා සන්තකයේ ඇතහොත් මිස ද

යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් විකිණීම හා සම්බන්ධයෙන් කෙලින් ම හෝ වක්‍රව ආයතනය පිළිබඳව හෝ ආයතනය විසින් අනුමත කරන ලද නැතහොත් අනුමත කරන ලදැයි හැඟවෙන ප්‍රමිති පිරිවිතරක් පිළිබඳව හෝ කිසි සඳහනක් නොකළ යුතු ය.

නියමයක් මඟින් අනිවාර්ය සහතික ලකුණු ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

20. (1) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සඳහා හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නැතහොත් නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා හෝ සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිති පිරිවිතරක් වෙනුවෙන් පිළිගන්නා ලද සහතික ලකුණක්, 17 වන, 18 වන, 19 වන වගන්තිවල ද, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ ද, 21 වන වගන්තියේ ද විධිවිධානවලට යටත්ව, සභාවේ උපදෙස් මත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මඟින්, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන දිනයක සිට, ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදිතය සෑදීම, නිෂ්පාදනය, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා හෝ අනිවාර්ය සහතික ලකුණක් බවට ප්‍රකාශයට පත් කළ හැකි ය ; තවද ඒ ආකාරයෙන් ම ඒ ලකුණ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කිරීමට යෝජිත නියමය වෙනත් යම් ලිඛිත නීතියක විෂය කරුණ වන්නා වූ යම් වෙළෙඳ ද්‍රව්‍යයකට හෝ නිෂ්පාදිතයකට හෝ වෙළෙඳ ද්‍රව්‍යයක් නැතහොත් නිෂ්පාදිතයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීමට අදාළ වේ නම්, ඒ වෙනත් නීතිය පිළිබඳ විෂය හෝ කර්තව්‍යය පවරා ඇති අමාත්‍යවරයා විමසීමෙන් පසු, අමාත්‍යවරයා විසින් ඒ නියමය කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නියමයක නිශ්චය කොට දැක්වෙන දිනය, නියමයේ දිනයට මාස තුනකට වඩා කලින් දිනයක් නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්, ඉන් පසුව කරන ලදුව ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මඟින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ සංශෝධනය කිරීම හෝ කළ හැකි ය.

20 වන වගන්තිය යටතේ නියමයක් කිරීමේ චේතනාව පිළිබඳ දැන්වීම.

21. (1) 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට තමා අදහස් කරන බව යම් සහතික ලකුණක් පිළිගෙන ඇත්තේ යම් ප්‍රමිති පිරිවිතරක් වෙනුවෙන් ද එහි නාමය සහ අංකය ද ඒ සහතික ලකුණ ද දක්වෙන්නා වූ ද යෝජිත නියමයට විරෝධතා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාර ගන්නේ යම් දිනයක ද නැතහොත් යම් දිනයකට පෙර ද, ඒ දිනය නිශ්චය කොට දැක්වෙන්නාවූ ද නිවේදනයක් ගැසට් පත්‍රයෙහි සහ එක් සිංහල පුවත්පතක, දෙමළ පුවත්පතක සහ ඉංග්‍රීසි පුවත්පතක පළකර ඇත්නම් මිස, අමාත්‍යවරයා විසින් එවැනි නියමයක් නොකළ යුතු ය.

(2) එසේ ඉදිරිපත් කරන සෑම විරෝධතාවක්ම, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු අතර යෝජිත නියමයට විරෝධය පානුයේ යම් හේතු මත ද ඒ හේතු දක්වෙන ප්‍රකාශයක් එහි ඇතුළත් විය යුතු ය.

(3) තමා වෙත ලැබෙන සෑම විරෝධපෑමක් ම අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් සභාවේ සභාපතිවරයා වෙත යැවිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ එවන ලද සෑම විරෝධතා වක්ම සභාව විසින් සලකා බැලිය යුතු අතර, ඒ විරෝධතා පිළිබඳ විමර්ශනය කිරීම සඳහා, අවශ්‍යයැයි සභාව සලකන පරීක්ෂණ පැවැත්විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වන දිනය, ස්ථානය හා වේලාව පිළිබඳව ලිඛිත දැන්වීමක්, විරෝධතාව පාන තැනැත්තාට දෙනු ලැබිය යුතු ය. විරෝධය පාන තැනැත්තාට හෝ ඔහු විසින් ලියවිල්ලකින් යථා පරිදි බලය දෙන ලද තැනැත්ත කුට, ඒ පරීක්ෂණයට පැමිණ සිටීමටත් ඒ විරෝධතාව පිළිබඳව කරුණු කියා සිටීමටත් හිමිකම් තිබිය යුතු ය.

(6) සභාව විසින් (4) වන උපවගන්තිය යටතේ සලකා බලන ලද විරෝධතාවක් පිළිබඳව සභාවේ තීරණය, අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැන්විය යුතු අතර, ඒ තීරණය ඔහු විසින් ඒ විරෝධය ඉදිරිපත් කළ තැනැත්තාට, ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අභියාචනා.

22. 21 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ සභාව විසින් සලකා බලන ලද යම් විරෝධතාවක් පිළිබඳව සභාවේ තීරණ යෙන් අතෘප්ත යම් තැනැත්තකු විසින් ඒ තීරණය පිළිබඳ දැනුම් දීම තමා වෙත ලැබී දවස් පහළොවක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, ඒ තීරණයට විරුද්ධව ලියවිල්ල කින් අභියාචනා කළ හැකිය. එවැනි අභියාචනයක් පිළිබඳව ලේකම්වරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක වන්නේ ය.

20 වන වගන්තිය අදාළ වන වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් බලපත්‍රයක් යටතේ හැර සහ ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය පිරිවිතර ආදියට අනුකූල වන්නේ නම් මිස, විකිණීම තහනම් බව.

**23.** යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සඳහා නැතහොත් යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා, යම් සහතික ලකුණක් අනිවාර්ය සහතික ලකුණක් බවට, 20 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කොට ඇති අවස්ථාවක, ඒ නියමයෙහි නිශ්චය කොට දැක්වෙන දිනයක පටන්, කිසිම තැනැත්තකු විසින්—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා බලය දුන් වෙනත් යම් නිලධරයකු විසින් හෝ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ හැර ; සහ

(ආ) ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය—

(i) අදාළ ප්‍රමිති පිරිවිතරට අනුකූලවන්නේ නම් ; හෝ

(ii) ඒ අදාළ ප්‍රමිති පිරිවිතරට අනුකූලව සෑදූ නිෂ්පාදනය කර, සකස් කර හෝ පිරියම් කර ඇත්නම් මිස

ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය විකිණීම නොකළ යුතු ය.

අවසර පත්‍ර නිකුත් කිරීම.

**24.** (1) මේ පනතේ කාර්ය සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයා වෙත හෝ ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) ඉල්ලුම්කරුගේ ව්‍යාපාර ආයතනයෙහි පරීක්ෂණ පහසුකම් තිබෙන බව ඔප්පු කර තිබේ නම් සහ ලබාගෙන පරීක්ෂා කිරීමට යෙදුණු සැම්පල අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූලවන්නේ නම් ද ;

(ආ) අවසර පත්‍රයක් දීම පිණිස ඊට ඈඳා ඇති සාමාන්‍ය කොන්දේසි පිළිගැනීමට ඉල්ලුම්කරු එකඟ වන්නේ නම් ද ;

(ඇ) අවසර පත්‍රය නිකුත් කරනු ලබන එකී වෙළෙඳ ද්‍රව්‍යයට හෝ නිෂ්පාදනයට අදාළව නියම කරනු ලැබ ඇති විශේෂ කොන්දේසි පිළිගැනීමට ඉල්ලුම්කරු එකඟ වන්නේ නම් ද ;

(ඈ) අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ගාස්තුවක් ඉල්ලුම්කරු විසින් ගෙවන්නේ නම් හා මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව ඔහු ක්‍රියා කරන්නේ නම් ද

මිස, මේ වගන්තිය යටතේ කිසිම අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක්ම මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු අතර, තත් කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට එය වලංගු විය යුතු ය; එමෙන්ම එසේ නියම කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, එය නිකුත් කරනු ලැබූ තැනැත්තාට එය අවලංගු කරන බවට ලිඛිතව දැනුම් දීමකින් පසු, මේ පනතේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග අනුව ක්‍රියා නොකිරීමේ හේතුවෙන්, කවර හෝ වේලාවක දී අවලංගු කළ හැකි ය.

(5) මේ පනත යටතේ අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එය ප්‍රතික්ෂේප කරන ලද බවට දැන්වීමක් ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ තැනැත්තා වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයා විසින් හෝ යවනු ලැබිය යුතු ය.

(6) අවසර පත්‍රයක් නිකුත් කිරීම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයා විසින් හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබීමෙන් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ දැන්වීම ලැබුණු දිනෙන් පසු දවස් පහළොවක් ඇතුළත දී, ඒ ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීමට විරුද්ධව, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, ලියවිල්ලකින් අභියාචනය කළ හැකිය. එවැනි යම් අභියාචනයක් පිළිබඳව ලේකම්වරයාගේ තීරණ අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

## III වන කොටස

## ආයතනයේ කාර්ය මණ්ඩලය

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

25. (1) යෝග්‍ය විද්‍යාත්මක සුදුසුකම් හෝ තාක්ෂණික සුදුසුකම් හෝ විද්‍යාත්මක සහ තාක්ෂණික සුදුසුකම් හෝ ඇති තැනැත්තකු ආයතනයේ (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල් ධුරයට, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා කොන්දේසි, අමාත්‍යවරයා විසින් තීරණය කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවන පාරිශ්‍රමිකය, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව තීරණය කළ යුතු ය.

(4) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවට ඒ කාලසීමාව තුළ කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(5) 3 වන වගන්තිය අනුව සභාව විසින් සම්මත කර ගන්නා ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතනයේ වැඩ සංවිධානය කිරීම, කර ගෙන යාම සහ මෙහෙයවීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කර්තව්‍ය විය යුතු ය.

26. (1) ආයතනය පිහිටුවා ඇත්තේ යම් අරමුණු සඳහා ද ඒ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යැයි සභාව සලකන වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්, සභාව විසින් පත් කළ හැකි ය.

ආයතනයේ වෙනත් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාර යකින් සහ ප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, එසේම නිශ්චය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) සභාවේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, තාවකාලිකව පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟවී ඇති තැනැත්තකු ආයතනය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා ආයතනය යටතේ සේවය කරන යම් කාලයක්, ඒ එකඟවීමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

27. අධ්‍යක්ෂ ජනරාල්වරයා හැර, ආයතනයේ නිලධරයන් සහ සේවකයන් සේවයෙන් පහ කිරීම ද ඇතුළුව, ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සභාවට බලය ඇත්තේ ය.

ආයතනයේ නිලධරයන් හා සේවකයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සභාවට බලය ඇති බව.

සභාවේ බලතල පැවරීම.

28. (1) ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෙනත් නිලධරයන් හෝ සේවකයන් පත් කිරීම සම්බන්ධයෙන් සහ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔවුන් සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් සභාව සතු බලතල සියල්ලම හෝ ඉන් යමක් හෝ සභාව විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරිය හැකි ය. තමා වෙත පවරා දෙන ලද බලතල යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන එවැනි යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ පාරිශ්‍රමික ද ඇතුළුව සේවා නියුක්ත කොන්දේසි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ එකඟත්වය ඇතිව නිර්ණය කළ යුතුය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව මිස, ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන කිසිම තැනැත්තකුගේ සේවය ඉල්ලා සිටීම හෝ සේවය ලබා ගැනීම සඳහා ගිවිසුම්වලට ඇතුළත්වීම හෝ එවැනි තැනැත්තකු පත් කිරීම හෝ නොකළ යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් නිලධරයකු හෝ සේවකයකු සේවයෙන් පහ කිරීම සභාවේ පූර්ව අනුමැතිය ඇතිව කළ යුතු ය.

පරීක්ෂකයන් පත් කිරීම.

29. (1) සභාවේ මතය අනුව යෝග්‍ය සුදුසුකම් ඇති, කාර්ය මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ සභාව විසින් මේ පනතේ කාර්ය සඳහා පරීක්ෂකවරයකු වශයෙන් පත් කළ හැකිය.

(2) සෑම පරීක්ෂකවරයකුටම, ඔහු මේ පනතේ කාර්යය සඳහා පරීක්ෂකවරයකු ලෙස පත් කොට ඇති බවට සහතිකයක්, සභාව විසින් සැපයිය යුතු ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන්නා වූ ද (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂකවරයකු ලෙස පත් කොට ඇත්තා වූ ද තැනැත්තකුට සභාව විසින් නිර්ණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

පරීක්ෂක වරයන්ගේ බලතල.

30. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් වැඩ බැලීමට ලියවිල්ලකින් බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින්, පොදුවේ හෝ නිශ්චිතව හෝ තත් කාර්යය සඳහා නියමයක් කරනු ලැබුවහොත් මේ පනතේ කාර්ය සඳහා යම් පරීක්ෂක්වරයකුට—

(අ) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සඳහා නැතහොත් එය සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා ප්‍රමිති පිරිවිතරක් හෝ සහතික ලකුණක් ඇත් ද ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය සාදන, නිෂ්පාදනය කරන, සකස් කරන හෝ පිරියම් කරන නැතහොත් එසේ සාදන, නිෂ්පාදනය කරන, සකස් කරන හෝ පිරියම් කරන බවට සාධාරණ සැකයක් ඇති නැතහොත් එවැනි යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් තිබෙන බවට හෝ වෙළෙඳාම සඳහා තබා ඇති බවට සාධාරණ සැකයක් ඇති කවර හෝ

ස්ථානයකට, කලින් දැනුම් දීමක් නොමැතිව, ව්‍යාපාර වේලාවන් ඇතුළත කවර හෝ වේලාවක දී, දහවල් හෝ රාත්‍රි කාලයේ ඇතුළු විය හැකිය ;

(ආ) ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය නැතහොත් එය සෑදීමෙහි, නිෂ්පාදනය කිරීමෙහි, සකස් කිරීමෙහි හෝ පිරියම් කිරීමෙහි ලා පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට අදහස් කර ඇතැයි සැක කරන යම් ද්‍රව්‍යයක් හෝ මූල ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම හෝ ඒවායේ සැම්පල් ගැනීම ද එවැනි යම් වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදන නැතහොත් ද්‍රව්‍ය හෝ මූල ද්‍රව්‍ය යම් ප්‍රමාණයක් අඩංගුව ඇති හෝ අඩංගුව ඇතැයි සැක කරන යම් ඇසුරුමක් හෝ බහලුවක් විවෘත කිරීම ද කළ හැකි ය ;

(ඇ) සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සඳහා ප්‍රමිති පිරිවිතරක් හෝ සහතික ලකුණක් ඇති යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සම්බන්ධයෙන් එවැනි යම් ස්ථානයක කරගෙන යන යම් ක්‍රියාවලියක් පරීක්ෂා කළ හැකිය ;

(ඈ) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම සම්බන්ධයෙන්, යම් තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ නැතහොත් ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ ඇති යම් පොතක්, ඇන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ වෙනත් ලියවිල්ලක් එහිදීම හා ඒ අවස්ථාවේම ඉදිරිපත් කරන ලෙස නැතහොත් පරීක්ෂක වරයා විසින් නියම කරන වේලාවක දී සහ ස්ථානයක දී ඉදිරිපත් කරන ලෙස, කවර හෝ වේලාවක ඒ තැනැත්තාට නියම කළ හැකි ය ;

(ඉ) එවැනි යම් පොතක්, ඇන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ වෙනත් ලියවිල්ලක් සෝදිසි කිරීම, (අ) ඡේදයේ සඳහන් යම් වෙළෙඳ ද්‍රව්‍යයකට හෝ නිෂ්පාදනයකට නැතහොත් මේ පනත යටතේ නිකුත් කළ හෝ නිකුත් කිරීමට ඇති යම් අවසර පත්‍රයකට අදාළ වන එවැනි යම් පොතක, ඇන්වීමක, වාර්තාවක, ලැයිස්තුවක හෝ වෙනත් ලියවිල්ලක පිටපත් ගැනීම හෝ ඒවායින් උධෘත ගැනීම ද ඒවායේ ඇතුළත් යම් සටහන් පිළිබඳව පැහැදිලි කරන ලෙස කවර හෝ තැනැත්තකුට නියම කිරීම ද තමාගේ මතය අනුව මේ පනත යටතේ යම් වරදක් පිළිබඳව සාක්ෂි ලබාගත හැකි එවැනි යම් පොතක්, ඇන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ වෙනත් ලියවිල්ලක් අත්කර ගැනීම ද කළ හැකිය ;

(ඊ) ඉහත කී බලතල ප්‍රකාර ඔහු ඇතුළු වූ යම් ස්ථානයක සිට ඔහුට හමුවන සෑම තැනැත්තකුගෙන්ම හෝ එවැනි යම් ස්ථානයක සේවයේ නියුක්තව

ඇතැයි හෝ සේවයේ නියුක්තව සිටියේ යැයි විශ්වාස කිරීමට නැතහොත් මේ උපවගන්තියේ සඳහන් කිසිවක සන්තකය, භාරය හෝ පාලනය දරන්නේ යැයි විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇති සෑම තැනැත්තකු ගෙන්ම ඔහු විසින් විමර්ශනය කරනු ලබන කවර හෝ කාරණයක් සම්බන්ධයෙන්, තනිවම හෝ යෝග්‍ය යැයි ඔහු අදහස් කරනු වෙනත් යම් තැනැත්තන් ඉදිරියේ හෝ ප්‍රශ්න කළ හැකිය ;

(උ) ඔහු විසින් නියම කරනු ලබන වේලාවක දී හා ස්ථානයක දී ඔහු ඉදිරියේ පෙනී සිටින ලෙස (ඈ) ඡේදයේ, (ඉ) ඡේදයේ හෝ (ඊ) ඡේදයේ සඳහන් කවර හෝ තැනැත් තකුට නියම කිරීම හා තමා විසින් විමර්ශනය කරගෙන යනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ගෙන් ප්‍රශ්න කිරීම කළ හැකි ය ;

(ඌ) ස්වකීය කාර්යයන් ඉටු කිරීමෙහි ලා යම් බරපතල අවහිර යක් බලාපොරොත්තු වීමට සාධාරණ හේතු ඇත්නම් තමාට සහාය වීම පිණිස පොලිස් නිලධරයන් එක්කෙනා කුගේ හෝ වැඩි ගණනකගේ සේවය ලබාගත හැකිය ; තවද

(එ) මේ උපවගන්තියේ ඉහතින් වූ ඡේදවලින් පවරන ලද බල තල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඊට ආනුෂංගික වූ වෙනත් යම් බලතල ක්‍රියාත්මක කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පරීක්ෂකවරයකු විසින් ඉල්ලා සිටින යම් පහසුකම්, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ස්ථානයක් භාරව සිටින තැනැත්තකු විසින්, සෑම විටම සැපයිය යුතු ය.

(3) මේ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති කවර හෝ බලතල ක්‍රියාත්මක කරන යම් පරීක්ෂකයකු විසින්, 29 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තමා වෙත සපයා ඇති සහතිකය සහ, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ලිඛිත නියමයන්, ඉල්ලා සිටිනු ලැබූ විට, ඉදිරිපත් කළ යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය.

**31.** සභාව විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජික යන්ට විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ විශ්‍රාම දීමනාවක් ගෙවීම සඳහා වන විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක අරමුදලක් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුභ සිද්ධිය පිණිස වන එවැනි වෙනත් යෝජනා ක්‍රම ද කාර්ය මණ්ඩලයේ මියගිය සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් සැපයීම සඳහා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුද ලක් හෝ ක්‍රමයක් පිහිටුවා විධිමත් කරගත හැකි අතර, එවැනි යම් යෝජනා ක්‍රමයකට හෝ අරමුදලකට දායක මුදල් ගෙවන ලෙස ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට නියම කළ හැකිය. තවද සභාව විසින් දායක මුදල් ඒ සාමාජිකයන්ගේ වැටුප් හෝ වේතනවලින් අඩුකර ගැනීම ද ආයතනයේ ආදායමින් එවැනි යම් යෝජනා ක්‍රමයකට හෝ අරමුදලකට දායක මුදල් ගෙවීම ද කළ හැකි ය.

## IV වන කොටස

### ආයතනයේ මුදල් සහ ගිණුම්

32. (1) ආයතනයට, සංචිත අරමුදල යන නමින් හැඳින්වෙන අරමුදලක් විය යුතු ය. සංචිත අරමුදල.

(2) සංචිත අරමුදලට—

(අ) ආයතනයේ ප්‍රාග්ධන වියදම් වශයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ආ) 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනතේ 31 වන වගන්තිය මගින් පිහිටුවන ලද ප්‍රාග්ධන අරමුදලේ බැරව ඇති සියලු මුදල් ප්‍රමාණයන්

ගෙවනු ලැබිය යුතු ය.

(3) සංචිත අරමුදලට බැර කරනු ලබන සියලු මුදල් ප්‍රාග්ධන ස්වභාවයක වූ සියලු වියදම් සඳහා සහ සභාව විසින් නිරණය කරනු ලබන වෙනත් යම් කාර්ය සඳහා ප්‍රයෝජනයට ගත යුතු ය.

33. (1) ආයතනයේ ආදායම්— ආයතනයේ ආදායම් සහ නිගත් වූ වියදම්.

(අ) (2) වන උපවගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් විසර්ජනය කරන මුදල් ;

(ආ) ආයතනයේ නිෂ්පාදනය සහ සේවාවන් අලෙවියෙන් ලැබී උපචිත වන යම් මුදල් ;

(ඇ) ආයතනය විසින් එහි නිෂ්පාදන, සේවා සහ ප්‍රකාශන විකිණීම සම්බන්ධයෙන්, යම්කිසි නිශ්චිත කාලසීමාවක් ඇතුළත, ආයතනය සඳහා මිල ප්‍රතිපත්තිය තීරණය කිරීමෙන් සභාව වැළැක්වීමට ආණ්ඩුව එළඹුනු තීරණයක ප්‍රතිඵලයක් වශයෙන්, ආණ්ඩුවෙන් ලැබුණු යම් සහනාධාර ; සහ

(ඈ) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ ඇතුළුව වෙනත් සුළු ආදායම්

වලින් සමන්විත විය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ සඳහන් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින්, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුවෙන් විසර්ජනය කර ඇති මුදලින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරන යම් මුදල් ප්‍රමාණයක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, වාර්ෂිකව දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්ති යටතේ ලැබෙන මුදල් ආයතනය විසින් සභාවේ සාමාජිකයන්ගේ ද 16 වන වගන්තිය යටතේ පිහිටුවන ලද යම් කමිටුවක සාමාජිකයන්ගේ ද අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයන්ගේ ද දීමනා ගෙවීම ඇතුළුව ආයතනයේ වාර්ෂික නඩත්තු වියදම් පියවීම සඳහා යෙදිය යුතු ය. තව ද ආයතනයේ මුදල් වර්ෂය අවසානයේ දී වැය නොවී ඉතිරිව ඇති යම් ශේෂයක්, සභාවේ විධානවලට යටත්ව, ආයතනයේ ඊළඟ මුදල් වර්ෂයේ නඩත්තු වියදම් පියවීම සඳහා හෝ ආයතනය පිහිටුවා ඇත්තේ යම් අරමුණු අරභයා ද ඒ අරමුණු සඳහා හෝ ප්‍රයෝජනයට ගත හැකි ය.

**ආයතනයේ අයවැය ලේඛනය.**

34. ආයතනය විසින් සෑම මුදල් වර්ෂයක් සඳහා ම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර ඒ අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර තුන් මාසයකට පසු නොවන දිනයක, සභාව විසින් එය අනුමත කළ යුතු ය.

**ඉටු කරන ලද සේවා සඳහා ගාස්තු අය කිරීම සහ එකින් ලබන ආදායම් නියඳනය කිරීම.**

35. ආයතනය විසින් මේ පනත යටතේ ඉටු කරන ලද යම් සේවාවන් වෙනුවෙන්, යෝග්‍යයැයි ආයතනය සලකන යම් ගාස්තු අයකිරීමක් හෝ මූල්‍යමය ගෙවීම් ලබා ගැනීමේ පිළිවෙළක් යෙදීම, 48 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට යටත්ව, ආයතනය විසින් කළ හැකි අතර, ඒ ගාස්තු වශයෙන් හෝ එකී වැඩ පිළිවෙළ වෙනුවෙන් හෝ ලැබුණු මුදල් සම්බන්ධයෙන්, පාර්ලිමේන්තුව විසින් විසර්ජනය කරන ලද මුදල් සම්බන්ධයෙන් 33 වන වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චය කොට දක්වෙන ආකාරයටම, කටයුතු කළ හැකි ය.

**ආයතනයට කරන පරිත්‍යාග සහ ආයක මුදල් ගෙවීම.**

36. ආයතනය විසින් කවර හෝ තැනැත්තකුගෙන් පරිත්‍යාග සහ ආයක මුදල් ලැබිය හැකි ය. එසේ ලැබෙන මුදල්, ඒ පරිත්‍යාගය හෝ ආයක වීම කළ තැනැත්තා විසින් නම් කරන ලද කාර්ය සඳහා, ඒ පරිත්‍යාගදායකයා හෝ දායකයා විසින් නියම කරන ලද කොන්දේසිවලට අනුකූලව ආයතනය විසින් ප්‍රයෝජනයට ගත යුතු ය. එසේ යම් කාර්යයක් නම් කර නොමැති නම් හෝ කොන්දේසි කිසිවක් එසේ නියම කර නොමැති නම්, ඒ මුදල්, 33 වන වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චයකොට දක්වෙන ආකාරයට හෝ අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකට හෝ ප්‍රයෝජනයට ගත යුතු ය.

**මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.**

37. (1) ලිත් වර්ෂය ආයතනයේ මුදල් වර්ෂය විය යුතු ය.

(2) සභාව විසින්, ආයතනයේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි පොත් හා ගිණුම් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය

38. යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් ප්‍රමිති පිරිවිතරයකට අනුකූලවීමේ හෝ අනුකූලවන්නේ යැයි කියා සිටීම හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ පිරියම් කිරීම එවැනි යම් ප්‍රමිති පිරිවිතරයකට අනුකූල වන්නේ යයි හෝ අනුකූල වන්නේ යයි කියා සිටින විට හෝ සහතික ලකුණෙන් හෝ අනිවාර්ය සහතික ලකුණෙන් යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් හා සම්බන්ධයෙන් භාවිත කොට ඇති විට හෝ යන කරුණ නිසාම සභාවට හෝ එහි යම් සාමාජිකයකුට හෝ ආයතනයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පැන නොනැගිය යුතු ය.

සභාව සහ එහි සාමාජිකයන් ආරක්ෂා කිරීම.

39. (1) සභාවේ හෝ එහි කමිටුවක සෑම සාමාජිකයකු ද ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු ද පරීක්ෂකවරයකු ද ස්වකීය කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම, ස්වකීය කාර්ය කිරීමෙහි හෝ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා දැඩි රහස්‍යතාවයක් පිළිපදින බවට ගිවිසගනිමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය. ඔහු ඒ ප්‍රකාශයෙන්—

රහස්‍යභාවය.

(අ) යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ විට හෝ අධිකරණයක් ඉදිරිපිට ; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් අනුව හෝ වෙනත් යම් ලිඛිත නීතියක් අනුව ක්‍රියා කිරීම පිණිස ; හෝ

(ඇ) ස්වකීය කාර්ය කිරීමෙහි ලා හෝ කර්තව්‍ය ඉටු කිරීමෙහිලා හැර කිසි තොරතුරක් හෙළිදරව් නොකරන බවට ඒ ප්‍රකාශයෙන් ගිවිසගත යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් අමාත්‍යවරයා වෙත හෝ සභාව වෙත, හෝ සභාවේ යම් කමිටුවක් නැතහොත් නියෝජිතයකු වෙත හෝ යම් පරීක්ෂකවරයකු වෙත හෝ වෙනත් යම් තැනැත්තකු වෙත, මේ පනත ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කාර්ය සඳහා යම් තොරතුරක් හෙළිදරව් කිරීමෙන්, පේටන්ට් බලපත්‍රයක් සඳහා පසුව ඉදිරිපත් කරන යම් ඉල්ලුම් පත්‍රයකට හානියක් නොවිය යුතු ය.

40. (1) ආයතනයේ නිලධරයකු විසින් කරන ලද සොයාගැනීම් හා නව නිපැයුම් පිළිබඳව සහ කාර්ය ක්‍රම, උපකරණ හා යන්ත්‍රවලට අදාළව කරන වැඩිදියුණු කිරීම් පිළිබඳව සියලු අයිතිවාසිකම් ආයතනයට පැවරෙන අතර ඒවා ආයතනයේ දේපළ බවට පත්විය යුතු ය. තවද ආයතනය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව සහ එසේම තීරණය කරනු ලැබිය හැකි යම් ගාස්තු හෝ රාජ්‍යභාග ගෙවීමට යටත්ව ඒවා පොදු යහපත පිණිස ප්‍රයෝජනයට ගැනීම සඳහා ලබා ගත හැකි විය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් කරන ලද සොයා ගැනීම්, නව නිපැයුම් සහ වැඩිදියුණු කිරීම්, පිළිබඳ අයිතිවාසිකම් ආයතනය වෙත පැවරෙන බව.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් සොයා ගැනීමක්, නව නිපැයුමක්, හෝ වැඩි දියුණු කිරීමක් කළ, ආයතනයේ යම් නිලධරයකුට සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ආයතනයේ අරමුදලින් යම් ප්‍රසාද මුදලක් ගෙවීම හෝ

ඒ සොයා ගැනීමෙන්, නව නිපැයුමෙන් හෝ වැඩි දියුණු කිරීමෙන් අත්වන ලාභයෙන් කොටසක් ලබා ගැනීමට විධිවිධාන සැලසීම, ආයතනය විසින් කළ හැකි ය.

(3) ආයතනයේ යම් නිලධරයකු විසින් කරන ලද නව නිපැයුමක් වෙනුවෙන් ආයතනය විසින් රාජසන්නස ඉල්ලුම් කළ හැකි අතර, 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ කාර්ය සඳහා, ආයතනය නිපැයුම්කරුගේ පැවරුම්ලාභියා ලෙස සැලකිය යුතු ය.

ආයතනයට රජයේ දේපළ ලබා දීම.

41. (1) ආයතනයේ කාර්ය සඳහා රජයේ යම් නිශ්චිත දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් වශයෙන් ලබා දිය හැකි කාර්යයක් ලෙස සැලකිය යුතු ය. තව ද ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, ආයතනයට ඒ දේපළ විෂය කොට කරන විශේෂ ප්‍රදානයකට හෝ බද්දකට අදාළ විය යුතුය.

(2) ආයතනයේ කාර්ය සඳහා, රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ දේපළ අයත් වූ හෝ ඒ දේපළෙහි සන්තකය දරන අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, ඒ චංචල දේපළෙහි සන්තකය සහ ප්‍රයෝජනය, ආයතනයට පවරා සතු කර දිය හැකි ය.

බදු හා ගාස්තුවලින් නිදහස් කිරීම.

42. (1) ආයතනය—

(අ) ආයතනයේ ආදායම හෝ ලාභ මත කවර හෝ බද්දක් ගෙවීමෙන් ; සහ

(ආ) ආයතනය විසින් හෝ වෙනුවෙන් හෝ ආයතනයේ වාසියට හෝ ලියා අත්සන් කරන සාධන පත්‍රයක් මත කවර හෝ මුද්දර ගාස්තුවක් ගෙවීමෙන්

නිදහස් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ආයතනය විසින් ආනයනය කරන හෝ මිල දී ගන්නා භාණ්ඩ සඳහා යම් රේගු බද්දක් ගෙවීමෙන්, ආයතනය නිදහස් කළ හැකි ය.

යම්කිසි කටයුත්තක්, වෙළෙඳ ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ ව්‍යාපෘතියක් කරගෙන යන යම් තැනැත්තකු විසින් ඇතැම් වචන පාවිච්චි කිරීම.

43. (1) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව හැර කිසිම තැනැත්තකු විසින්, "ප්‍රමිති ආයතනය" යන වචන හෝ ඒ තැනැත්තා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය බව හෝ ආයතනය සමඟ හවුලක් ඇති බව හෝ ආයතනය හා සම්බන්ධ බව හෝ හැඟවෙන වෙනත් යම් වචන ඇතුළත් කවර හෝ නාමයක් යටතේ, යම්කිසි කටයුත්තක්, වෙළෙඳ ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ ව්‍යාපෘතියක් පවත්වාගෙන නොයා යුතු ය.

(2) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව හැර—

(අ) "ප්‍රමිති" යන වචනය ඇතුළත් කිසිම වෙළෙඳ ලකුණක් 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යටතේ ලියාපදිංචි නොකළ යුතු ය;

(ආ) තත් කාර්යය සඳහා බලපත්‍රයකින් බලය ලබා ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් "ප්‍රමිති" යන වචනය ඇතුළත් ලකුණක් යටතේ හෝ ආයතනය විසින්, ඒ වෙළෙඳ ද්‍රව්‍යය හෝ භාණ්ඩය සඳහා අනුමත කරන ලද ප්‍රමිති පිරිවිතරයකට අනුකූල බවට හැඟීමක් ඇති කිරීමට ඉඩ ඇති ආකාරයකට ඒ වචනය යොදා ඇති විස්තරයක් යටතේ හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් විකිණීම නොකළ යුතු ය.

(3) මේ පනත ආරම්භවීමේ දී කිසියම් කටයුත්තක්, වෙළෙඳ ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ ව්‍යාපෘතියක් කරගෙන යන හෝ (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ යම් නාමයක් යටතේ ලියාපදිංචි වී ඇති හෝ යම් තැනැත්තකු විසින්, (1) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, අවස්ථාවෝචිත පරිදි ඒ කට යුත්ත වෙළෙඳ ව්‍යාපාරය කර්මාන්තය හෝ ව්‍යාපෘතිය කරගෙන යා හැකි ය; නැතහොත් ඒ නාමය යටතේ එසේ ලියාපදිංචිව සිටිය හැකි ය.

(4) මේ පනත ආරම්භ වන විට ලියාපදිංචි කර තිබුණු යම් වෙළෙඳ ලකුණකට හෝ ඒ වෙළෙඳ ලකුණු යටතේ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් විකිණීම කෙරෙහි හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන බල නොපෑ යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ දෙන ලද යම් අනුමැතියක් ඉවත් කර ගැනීම ව්‍යාකූලතාවයක් හෝ අයථා ප්‍රයෝජන ගැනීමක් වැළැක්වීම සඳහා අවශ්‍ය බව අමාත්‍යවරයාගේ මතය වේ නම් ඔහු විසින් කවර වේලාවක වුව ද එය ඉවත් කර ගත හැකි ය.

44. ආයතනය විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබූ විට, මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇති කවර හෝ තැනැත් තකු විසින්— නියම කරනු ලැබූ විට වෙළෙඳ ද්‍රව්‍යවල හෝ නිෂ්පාදනවල නියැදි ඉදිරිපත් කිරීම හෝ ඒ වෙළෙඳ ද්‍රව්‍ය හෝ නිෂ්පාදන පිළිබඳ විස්තර සැපයීම බලපත්‍ර නිකුත් කරනු ලැබූ තැනැත්තාගේ කාර්ය බව.

(අ) ඒ බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සඳහා ද ඒවායින්, ඒ ඉල්ලීමෙහි නිශ්චය කොට නියම කරනු ලැබිය හැකි නියැදි එසේම නිශ්චය කොට නියම කරනු ලැබිය හැකි කාලයක් ඇතු ළත, සභාව වෙත හෝ ආයතනය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු වෙත ඉදිරිපත් කළ යුතු ය; නැතහොත්

(ආ) ඒ ඉල්ලීමෙහි ලැබිය හැකි වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය පිළිබඳව හෝ එය තැනීම, නිෂ්පාදනය කිරීමට සකස් කිරීම හෝ පිරියම් කිරීම පිළිබඳව තොරතුරු එසේම නිශ්චය කොට නියම කරනු ලැබිය හැකි කාලයක් ඇතු ළත, සභාව වෙත හෝ ආයතනය විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු වෙත සැපයිය යුතු ය.

තවද ඒ තැනැත්තා, එවැනි ඉල්ලීමක් අනුව ක්‍රියා කළ යුතු ය.

වැරදි.

**45.** (1) (අ) 19 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ නැතහොත් 23 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ආ) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක කොන්දේසි උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ඇ) 39 වන වගන්තියේ විධිවිධාන හෝ 43 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ විධිවිධාන උල්ලංඝනය කරන ; හෝ

(ඈ) තමා පරීක්ෂකවරයකු බවට ව්‍යාජ ලෙස පෙනී සිටින ; හෝ

(ඉ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නාවූ ද සාවද්‍ය බව තමා දන්නාවූ ද යම් අදාළ ප්‍රකාශයක් පරීක්ෂකවරයකුට කරන ; හෝ

(ඊ) පරීක්ෂකවරයකු විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා අසනු ලබන අදාළ ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(උ) පරීක්ෂකවරයකු විසින් කරන යම් නීත්‍යානුකූල විධානයක් අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(ඌ) ස්වකීය බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කරන පරීක්ෂකවරයකුට බාධා කරන හෝ අවහිර කරන ; හෝ

(එ) 44 වන වගන්තිය යටතේ කරන යම් ඉල්ලීමකට අනුව ක්‍රියා කිරීම පැහැර හරින

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට චෝදනා කරනු ලැබූ විටක, ඔහු—

(අ) ඒ වරද සිදුකිරීම වැළැක්වීමට සියලු යුක්තිසහගත ආරක්ෂක විධිවිධාන තමා විසින් යොදනා ලද බව ; සහ

(ආ) 23 වන වගන්තිය යටතේ චෝදනාව අදාළ වන වෙළෙඳ ද්‍රව්‍යය හෝ නිෂ්පාදනය තමා විසින් ලබා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා පිළිබඳව තමා වෙත ඇති හෝ යුක්ති

සහගතව තමා වෙත තිබිය යුතු වූ සියලු තොරතුරු, සභාව විසින් හෝ පරීක්ෂකවරයකු විසින් හෝ ඉල්ලා සිටි විට සපයන ලද බව

ඔප්පු කළහොත්, ඔහු ඒ වරදට වරදකරු නොවන්නේ යැයි සැලකිය යුතුය.

**46.** (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත්— දණ්ඩන.

(i) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් හාරදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ද ;

(ii) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සිට (ඖ) ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ද ;

(iii) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (එ) ඡේදයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ද

යටත් විය යුතු ය.

(2) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ සඳහන් වරදකට නැතහොත් 43 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරන කවර හෝ අවස්ථාවක අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව ඒ වරද සිදු කරන ලද්දේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ සියල්ලම හෝ ඉන් යම් කොටසක් රජය සතු කිරීමේ ආඥාවක් අධිකරණය විසින් කළ හැකිය. රජය සතු කරන ලෙස ආඥා කරනු ලැබූ භාණ්ඩ, අමාත්‍යවරයා විධාන කරන යම් ආකාරයකට බැහැර කළ යුතු ය.

**47.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක— **පුද්ගල මණ්ඩල විසින්** කරන වැරදි.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකුම විසින් ඒ වරද කරන ලද සේ සැලකිය යුතු ය ; තවද

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් ඒ ආයතනයේ සෑම හවුල්කරුවකු විසින් ම ඒ වරද කරන ලද සේ සැලකිය යුතු ය:

එසේ වුවද ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම් නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔප්පු කළහොත්, එවැනි කිසිම අධ්‍යක්ෂවරයකු විසින් මේ පනත යටතේ වරදක් කරන ලදැයි නොසැලකිය යුතු ය.

නියෝග. 48. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා සහ නියෝග සෑදීමට මේ පනතින් බලය ලැබී ඇති හෝ නියෝග සෑදිය යුතුයයි මේ පනතින් නියමිත සියලු කරුණු සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින යෙහි හෝ නියෝගයේ නිශ්චය කොට නියම කර ඇති යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම ඒ යටතේ එතෙක් කරන ලද කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව එම අනනුමතයේ දින සිට, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

ඉවත් කිරීම සහ අත් හැරීම්. 49. (1) 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබුවද—

(අ) කාර්යාංශයේ සේවයේ නියුක්ත සියලු නිලධරයන් සහ සේවකයන් ආයතනයේ නිලධරයන් සහ සේවකයන් ලෙස සැලකිය යුතු අතර කාර්යාංශයේ සේවයෙහි ඔවුන් ඇරූ තරාතිරමට හැකිතාක් ආසන්නව එමෙන්ම ඔවුන් විසින් භුක්ති විඳින ලද නියමයන් හා කොන්දේසි මත බුර දැරිය යුතු ය;

(ආ) කාර්යාංශය විසින් හෝ සමඟ හෝ සඳහා හෝ දරන ලද සියලු ණය, වගකීම් හා බැඳීම් ද ඇතුළත් වී සිටිත නැත හොත් ලියා අත්සන් කර ඇති සියලු ගිවිසුම් හා එකඟ වීම් ද කිරීමට නියම කරගෙන ඇති සියලු කාරණා හෝ දේවල් ද මේ උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන

මලට යටත්ව ආයතනය විසින් හෝ සමග හෝ සඳහා හෝ දරන ලද, ඇතුළත් වී සිටින, ලියා අත්සන් කර ඇති නැතහොත් කිරීමට නියම කරගෙන ඇති සේ සැලකිය යුතු ය ;

(ඇ) කාර්යාංශය විසින් හෝ කාර්යාංශයට විරුද්ධව හෝ පවරා ඇති නැතහොත් පවරනු ලැබිය හැකිව තිබුණු සියලු සිවිල් නඩු, අපරාධ නඩු හෝ වෙනත් නඩු කටයුතු, මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන මලට යටත්ව, ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව හෝ පවත්වාගෙන යා යුතු ය; නැතහොත් පැවරිය යුතු ය ;

(ඈ) කාර්යාංශයේ වාසියට හෝ කාර්යාංශයට විරුද්ධව හෝ නිසි අධිකරණයක් විසින් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා ආයතනයේ වාසියට හෝ ආයතනයට විරුද්ධව කරන ලද සේ සැලකිය යුතු ය ;

(ඉ) කාර්යාංශය වෙත සතු වී ඇති හෝ කාර්යාංශය විසින් නීත්‍යනුකූලව මිලදී ගෙන ඇති, අත්පත් කර ගෙන ඇති හෝ බද්දට ගෙන ඇති හෝ කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා වෙන්වී ඇති හෝ වෙනත් යම් ආකාරයකින් කාර්යාංශය වෙත පවරා ඇති හෝ කාර්යාංශයේ සන්තක යෙහි නැතහොත් පාලනය යටතේ ඇති සියලු චංචල හෝ නිශ්චල දේපළ, ඊට ආබද්ධ, අනුබද්ධ හෝ අදාළ භාර, බැඳීම්, බැරකම්, වෙන්කර තැබීම්, පරවශතා හෝ වෙනත් බැඳීම්වලට යටත්ව සහ නියමයන් හා කොන්දේසි මත, ආයතනය විසින් නැතහොත් ආයතනය සඳහා භාරයක් වශයෙන්, දැරිය යුතු ය ;

(ඊ) ඉවත් කරන ලද පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද්දාවූ ද මේ පනත ආරම්භ වන දිනයේ දී බලාත්මකව තිබුණාවූ ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නාවූ ද සියලු නියෝග, මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒවා මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම, කළ හැකිය ; තවද

(උ) ඉවත් කරන ලද පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කාර්යාංශයේ අරමුදල මේ පනත යටතේ පිහිටුවන ලද ආයතනයේ අරමුදලෙහි කොටසක් වන සේ සැලකිය යුතු ය.

**50.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"සහතික ලකුණ" යන්නෙන් 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, සහතික ලකුණක් බවට ප්‍රකාශයට පත් කර ඇති ලකුණක් අදහස් වේ ;

"ව්‍යවහාර විධි සංග්‍රහය" යන්නෙන්, යම් භාණ්ඩයක්, උපකරණයක්, මෙවලමක්, උපක්‍රමයක් හෝ කාර්ය ක්‍රමයක් සෑදීම, සවි කිරීම, අත්හදා බැලීම, ක්‍රියා කරවීම හෝ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් යොදාගත යුතු ක්‍රමය හෝ ක්‍රියාවලියට අදාළ රීති මාලාවක් අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්" යන්නෙන් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"පරීක්ෂක" යන්නෙන් 29 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂකවරයකු අදහස් වේ;

"ලකුණ" යන්නට යම් උපක්‍රමයක්, හණක්, ශීර්ෂයක්, ලේබලයක්, ටිකට් පතක්, විචිත්‍ර නිරූපණයක්, නාමයක්, අත්සනක්, කෘතියක්, අක්ෂරයක්, අංකයක් හෝ ඒවායේ සංකලනයක් ඇතුළත් වේ;

"විකිණීම" යන්නට විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නැතහොත් ඉදිරිපත් කිරීම හෝ විකිණීමේ කාර්යය සඳහා අපනයනය කිරීම හෝ විකිණීමේ නැතහොත් අපනයනය කිරීමේ කාර්යය සඳහා හෝ යම් වෙළෙඳ හෝ නිෂ්පාදන කාර්යයක් සඳහා හෝ සන්තකයේ තබා ගැනීම ඇතුළත් වේ;

"පිරිවිතර" යන්නෙන් යම් වෙළෙඳ ද්‍රව්‍යයක ස්වභාවය, තත්ත්වය, ශක්තිය, පරිශුද්ධභාවය, සංයුක්තිය, ප්‍රමාණය, පරිමාණය, බර, ශ්‍රේණිය, කල් පැවැත්ම, ප්‍රභවය, වයස හෝ වෙනත් ලක්ෂණ හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් හෝ නිෂ්පාදනයක් සෑදිය හැකි, නිෂ්පාදනය කළ හැකි, සකස් කළ හැකි හෝ පිරියම් කළ හැකි ද්‍රව්‍යය නැතහොත් මූල ද්‍රව්‍යය හෝ ආකාරය අදහස් වේ;

"ප්‍රමිති පිරිවිතර" යන්නෙන් ආයතනයේ සභාව විසින් අනුමත කර ඇති පිරිවිතරක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් මුළු වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.